## විශේෂ නිවේදනයයි.

ඊශ්‍රායලයේ වාසය කරන නැවත ශ්‍රී ලංකාව බලා යෑමට මේ වන විටත් ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ලියාපදිංචි වී සිටින සියලුම ශ්‍රී ලාංකික ප්‍රජාව වෙතයි,

ඊශ්‍රායලය තුල දෛනිකව වැඩිවන කොරෝනා වසංගත තත්වය හමුවේ නැවත මාතෘභූමිය වෙත යෑම සඳහා ඔබ විසින් මෙම තානාපති කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම් මෙම තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කරමින් එමඟින් ශ්‍රී ලංකාවේ අදාල බලධාරීන් දැනුවත් කර ඊශ්‍රායලය වෙත කඩිනමින් ගුවන් යානාවක් එවීමට කටයුතු කරන ලෙස වරින් වර අවධාරණය කරන ලද බැව් ඔබ දන්නා කරුණකි.

ඒ අනුව, අප විසින් කරන ලද එම ඉල්ලීම් වලට ප්‍රතිචාර දක්වමින් ඊශ්‍රායලය වෙත **2020.08.31** දින ගුවන් යානාවක් එවීමට නියමිතව ඇති බව ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් මෙම තානාපති කාර්යාලය වෙත අද දින දැනුම් දී ඇති බව සතුටින් ප්‍රකාශ කර සිටින අතර ඒ පිළිබඳව වැඩි විස්තර මේ වන තෙක් තානාපති කාර්යාලය වෙත දැනුම් දී නොමැති බැවින් එම විස්තර ලද විගස ඔබ සියලු දෙනා වෙත දැනුම් දීමට කටයුතු කරන බවටද අවධාරණයෙන් දන්වා සිටිනු ලැබේ.

එබැවින්, මේ වන විටත් රැකියාවන්හි නිරත වී සිටින අය ස්වකීය සේවායෝජකයන් හරහා විධිමත් ලෙසට ස්වකීය රැකියාවෙන් හිමිවිය යුතු දීමනා (හිඟ වැටුප්, විශ්‍රාම වැටුප්, රක්ෂණ ප්‍රතිලාභ) ලබා ගැනීමට කඩිනමින් කටයුතු කරන මෙන් මෙයින් දන්වා සිටිමු.

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
ටෙල් අවිව් ඊශ්‍රායලය

2020.08.19